# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2017 අප්‍රේල් මස 28 වන දින

## II වන කොටස

## අතිරේකය

**(2017.05.02 දින නිකුත් කරන ලදී)**

# පැනසෝමා ෆ්‍රෙන්ඩ්ෂිප් ෆෞන්ඩේෂන් (සංස්ථාගත කිරීමේ)

(පෞද්ගලික මන්ත්‍රීවරයකුගේ පනත් කෙටුම්පතකි.)

**පැනසෝමා ෆ්‍රෙන්ඩ්ෂිප් ෆෞන්ඩේෂන් සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

පුත්තලම දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු හෙක්ටර් අප්පුහාමි මහතා විසින් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීම පිණිසයි.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

මිළ : රු. 8.00 යි. තැපැල් ගාස්තුව : රු. 10.00 යි.

# පැනසෝමා ෆ්‍රෙන්ඩ්ෂිප් ෆෞන්ඩේෂන් (සංස්ථාගත කිරීමේ)

## පැනසෝමා ෆ්‍රෙන්ඩ්ෂිප් ෆෞන්ඩේෂන් සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

"පැනසෝමා ෆ්‍රෙන්ඩ්ෂිප් ෆෞන්ඩේෂන්" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන පදනමක්, එකී පදනමේ සාමාජිකයන් එකඟ වූ රීතිවලට අනුව එකී පදනමට, සම්බන්ධ සියලු කරුණු ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද : පූර්විකාව.

එකී පදනම පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කාරණා සඳහා ද, ඒ පරමාර්ථ සහ කාරණා මෙතෙක් කල් එකී පදනම විසින් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් ද, එකී පදනම සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති බැවින් ද, ඒ ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ.

**1.** මේ පනත 2017 අංක    දරන පැනසෝමා ෆ්‍රෙන්ඩ්ෂිප් ෆෞන්ඩේෂන් (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** (1) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසුව (මෙහි මින්මතු "ෆෞන්ඩේෂන්" යනුවෙන් සඳහන් කරනු ලබන) පැනසෝමා ෆ්‍රෙන්ඩ්ෂිප් ෆෞන්ඩේෂන් දැනට සාමාජිකයන්ව සිටින තැනැත්තන් සහ මෙයින් පිහිටුවනු ලබන සංස්ථාවට සාමාජිකයන් වශයෙන් මින් මතු ඇතුළත් කරනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) පැනසෝමා ෆ්‍රෙන්ඩ්ෂිප් ෆෞන්ඩේෂන් යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, ඒ නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, ඊට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි ය. තව ද, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද, එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරය එකී සංස්ථාවට තිබිය යුතු ය. පැනසෝමා ෆ්‍රෙන්ඩ්ෂිප් ෆෞන්ඩේෂන් සංස්ථාගත කිරීම.

(2) සංස්ථාව, 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය කිරීම) පනතේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා ස්වේච්ඡා සමාජ සංවිධානයක් වශයෙන් සලකනු ලැබිය යුතු අතර, එම පනතේ විධිවිධාන සංස්ථාවේ කටයුතු කළමනාකරණය සහ ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

**3.** සංස්ථාව පිහිටුවනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද ඒ පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) ජපානයේ යාන්ත්‍රික නව තාක්ෂණය හා කාබනික පොහොර නිපදවීම සම්බන්ධයෙන් ගොවි මහතුන් දැනුවත් කිරීම සඳහා ආදර්ශ කෘෂි ව්‍යාපෘතීන් ශ්‍රී ලංකාවේ ආරම්භ කිරීම ;

(ආ) උපකරණ භාවිතය සඳහා අවශ්‍ය තැන්වලට කෘෂි උපකරණ සපයා දී තරුණ ගොවියා කෘෂි කර්මාන්තයට නැඹුරු කිරීම තුළින් ලංකාවේ ආර්ථික භෝග නිෂ්පාදන ධාරිතාව වැඩිකිරීම හා කාර්යක්ෂම කිරීම;

(ඇ) ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම ගුරුවරුන්ට ජපානයේ කෘෂි කර්මාන්තය පිළිබඳව කෙටි කාලීන පුහුණුවක් ලබාදීමෙන් අනතුරුව අදාළ පාසල්වල කෘෂි ආදර්ශ ඇති කිරීමට අවශ්‍ය උපකරණ හා සේවා සැපයීම සම්බන්ධයෙන් කටයුතු කිරීම;

(ඈ) බඩ ඉරිඟු (Maize) ආශ්‍රිත කෘෂි නිෂ්පාදන වර්ධනය කිරීමට කටයුතු කිරීම හා සෙසු ධාන්‍ය වර්ග වගා කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා උපකාර කිරීම, අනුබල දීම;

(ඉ) නව වෙළඳපොළ පහසුකම් ඇති කිරීම;

(ඊ) කිරි නිෂ්පාදනය ක්‍රමවත් කිරීම හා පුළුල් කිරීම උදෙසා ජපානයෙන් ලබාදිය හැකි තාක්ෂණය හඳුන්වාදීම මෙන්ම සත්ව ආහාර පිණිස කාබනික අමුද්‍රව්‍ය නිෂ්පාදනය පුළුල් කරවීම සහ සේවා සැපයීම පිළිබඳ කටයුතු කිරීම;

(උ) දුෂ්කර ප්‍රදේශවල පාසල් සිසු සිසුවියනට ප්‍රවාහන පහසුකම් සලසනු වස් නොමිලයේ පාපැදි සැපයීම මෙන්ම පාසල් උපකරණ සැපයීමට කටයුතු කිරීම සහ ළදරු පාසල් අධ්‍යාපන කටයුතු නගා සිටුවීමට අවශ්‍ය පහසුකම් සැලසීම;

(ඌ) ආපද සහ වෙනත් සමාජ සත්කාර අවශ්‍ය අවස්ථාවල දී ජාත්‍යන්තර සහයෝගයන් ලබාගැනීම හා රජයේ නියමයන් අනුව ඒවා ක්‍රියාත්මක කිරීම;

(එ) රෝහල්, වෛද්‍ය සේවා සපයන ආයතන වැනි සෞඛ්‍ය අංශයේ ආයතන සඳහා අවශ්‍ය සේවා සහ උපකරණ සැපයීම ; සහ

(ඒ) ඉහත සඳහන් පරමාර්ථ සාක්ෂාත් කරගැනීම සඳහා ආනුෂංගික වන්නා වූ හෝ හිතකර වන්නා වූ වෙනත් සියලු දේ කිරීම.

(2) (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති පරමාර්ථ ක්‍රියාත්මක කිරීමේ දී ජාතිය, ආගම, භාෂාව, කුලය, ස්ත්‍රී පුරුෂ භාවය, දේශපාලනය මතය, උපන් ස්ථානය, හෝ වෙනයම් හේතුවක් මත පදනම් කරගත් වෙනස්කමකට භාජනය නොවන පරිදි ක්‍රියත්මක කිරීමට සංස්ථාව වගබලා ගත යුතු ය.

ආණ්ඩුවේ හෝ පළාත් සභාවක අමාත්‍යාංශයක හෝ දෙපාර්තමේන්තුවක කාර්ය සමග සංස්ථාවේ කාර්ය ගැටුම් සහගත නොවන බවට සංස්ථාව සහතික විය යුතු බව.

**4.** ආණ්ඩුවේ හෝ පළාත් සභාවක යම් අමාත්‍යාංශයක් හෝ දෙපාර්තමේන්තුවක් විසින් සමගාමීව පවත්වාගෙන යනු ලබන යම් කාර්යයක් සහ සංස්ථාවේ කාර්ය අතර කිසිදු ගැටුමක් නිර්මාණය නොවන ආකාරයෙන් සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කළ යුතු ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**5.** (1) මේ පනතේ විධිවිධානවලට යටත්ව සංස්ථාවේ කටයුතු කළමනාකරණය සහ පරිපාලනය, මේ පනතේ 7 වන වගන්තිය යටතේ සාදනු ලබන සංස්ථාවේ රීති මගින් නිශ්චය කරනු ලැබිය හැකි ධුර දරන්නන් යම් සංඛ්‍යාවකින් සමන්විත (මෙහි මින්මතු "කමිටුව" යනුවෙන් සඳහන් කරනු ලබන) කළමනාකරණ කමිටුව විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(2) (අ) මෙම පනත ආරම්භ වන දිනයට පෙරතුව ම වූ දිනයේ දී ධුර දරනු ලැබූ සංගමයේ කමිටුව, 7 වන වගන්තිය යටතේ සාදනු ලබන රීති මගින් විධිවිධාන සලස්වා ඇති ආකාරයට ප්‍රථම කමිටුව පත් කරනු ලබන හෝ තෝරා පත් කරනු ලබන තෙක්, සංස්ථාවේ කමිටුව වශයෙන් ක්‍රියා කළ යුතු ය.

(ආ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට වසරක් ඇතුළත සංස්ථාවේ පළමු කමිටුව පත්කිරීම හෝ තෝරා පත්කර ගැනීම කළ යුතු ය.

(3) (අ) අනුශාසකවරු හා උපදේශකවරු ද ඇතුළුව කමිටුවේ ධුර දරන සෑම ධුර දරන්නකු ම වර්ෂ තුනක කාලයක් සඳහා පත්කර ගත යුතු හෝ තෝරා පත්කර ගතයුතු අතර, එම වර්ෂ තුනක කාලසීමාව ඉකුත් වීමෙන් පසුව එම ධුර දරන්නා, අනුශාසකවරයා හෝ උපදේශකවරයා නැවත තෝරා පත්කර ගැනීම සඳහා සුදුස්සකු වන්නේ ය.

(ආ) යම් ධුර දරන නිලධරයකු මියයාම, ඉල්ලා අස්වීම, නොහැකියාවකට පත්වීම හෝ ධුරයෙන් ඉවත් කිරීම නිසා පුරප්පාඩුවක් ඇති වන අවස්ථාවක දී, කමිටුව විසින් සංස්ථාවේ රීති සැළකිල්ලට ගෙන එම පුරප්පාඩුව පිරවීම සඳහා යම් තැනැත්තකු තෝරා පත්කර ගත යුතු හෝ පත්කර ගත යුතු ය.

(ඇ) (ආ) ඡේදය යටතේ තෝරා පත්කර ගනු ලබන හෝ පත්කර ගනු ලබන තැනැත්තා ඔහු අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය සඳහා ධුර දැරිය යුතු ය.

**6.** මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, සංස්ථාවේ පරමාර්ථ හෝ ඒ අතුරින් යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය හෝ නංවාලීම සඳහා පහත සඳහන් අවශ්‍ය හෝ අපේක්ෂිත සියලු ක්‍රියා හා කාරණා කිරීමේ, ක්‍රියාත්මක කිරීමේ සහ ඉටු කිරීමේ බලය සංස්ථාවට තිබිය යුතු ය. සංස්ථාවේ බලතල.

(අ) සංස්ථාවේ කාර්යය සඳහා අවශ්‍ය වන්නා වූ ඉඩම් හෝ ගොඩනැගිලි මිල දී ගැනීම, අත්කර ගැනීම, කුලියට ගැනීම, ඉදිකිරීම සහ අළුත්වැඩියා කිරීම සහ අන්‍යාකාරයකින් ලබා ගැනීමට සහ සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව සුදුසු යැයි සැළකෙන අයුරින් ඒවා සම්බන්ධයෙන් ක්‍රියා කිරීම හෝ ඒවා බැහැර කිරීම ;

(ආ) ඇප සහිතව හෝ රහිතව ණයට ගැනීම හෝ රැස්කිරීම සහ මුදල් හෝ ද්‍රව්‍යවලින් ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග ලබා ගැනීම;

එසේ වුවද, සංස්ථාව වෙත ලබාදෙනු ලබන විදේශීය ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග සම්බන්ධයෙන් කමිටුව විසින් මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ පූර්ව ලිඛිත අනුමතය ලබාගත යුතු ය.

(ඇ) විනිමය බිල්පත් චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ වෙනත් ගණුදෙනු කළ හැකි සාධන පත්‍ර සකස් කිරීමට, ලිවීමට, භාරගැනීමට, වට්ටම් දීමට, පිටසන් කිරීමට, ගනුදෙනු කිරීමට, මිලට ගැනීමට, විකිණීමට සහ නිකුත්කිරීමට සහ යම් බැංකුවක ගිණුම් විවෘත කිරීමට ක්‍රියාත්මක කිරීමට, පවත්වාගෙන යාමට සහ වැසීමට;

(ඈ) සංස්ථාවේ කාර්යයන් සඳහා වහාම අවශ්‍ය නොවන යම් අරමුදල් කමිටුව විසින් තීරණය කරනු ලබන ආකාරයකින් අයෝජනය කිරීමට;

(ඉ) සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව ඉඩකඩම් හෝ පෞද්ගලික දේපළකට බලපාන්නා වූ යම් නීතිමය භාරයක් හා කොන්දේසි භාරගැනීමට, පිළිගැනීමට, ක්‍රියාත්මක කිරීමට, ඉටුකිරීමට සහ පරිපාලනය කිරීමට;

(ඊ) සංස්ථාවේ නිලධරයන් සහ සේවකයන් පත්කිරීම, සේවයෙහි නියුක්ත කිරීම, සේවයෙන් පහකිරීම හෝ සේවය අවසන් කිරීම සහ ඔවුන් විෂයෙහි විනය පාලනය පවත්වාගෙන යාම සහ සංස්ථාව විසින් තීරණය කරන ලද වැටුප්, දීමනා සහ පාරිතෝෂික ගෙවීම ; සහ

(උ) සංස්ථාවේ පරමාර්ථ නිසි ලෙස සහ ඵලදායීව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය හෝ සුදුසු වෙනත් සියලු යෝග්‍ය දෑ සිදුකිරීම.

**7.** (1) සංස්ථාව විසින් සාමාජිකයන්ගේ යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන්, මේ පනතට හෝ වෙනත් යම් ලිඛිත නීතියට අනනුකූල නොවන රීති, පහත සඳහන් සියලු කරුණු හෝ ඉන් කිසිවක් සඳහා කලින් කල සෑදීම නිත්‍යානුකූල විය යුතු ය. සංස්ථාවේ රීති.

(අ) සාමාජිකයන් වර්ග කිරීම, සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඉවත් කිරීම, නෙරපීම හෝ ඉල්ලා අස්වීම සහ සාමාජිකයන් විසින් ගෙවිය යුතු ගාස්තු ;

(ආ) කමිටුවේ ධුර දරන්නන් තෝරා පත්කර ගැනීම, ධුරය හිස් කිරීම හෝ ධුරයෙන් ඉවත් කිරීම සහ ධුර දරන්නන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය;

(ඇ) සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, අනුයෝජිතයන්ගේ පත්වීම, බලතල, කාර්ය හා කර්තව්‍ය සහ කොන්දේසි සහ නියමයන් ;

(ඈ) කමිටුවේ හෝ එහි යම් අනුකමිටුවක රැස්වීම් කැඳවීමේ දී හා පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු කාර්යය පටිපාටිය, රැස්වීම් පිළිබඳ නිවේදන හා න්‍යාය පත්‍ර, ගණපූර්ණය සහ ඒ රැස්වීම්වල කටයුතු කරගෙන යාම;

(ඉ) සංස්ථාවේ සහ කමිටුවේ සාමාජිකයකු වීමට අවශ්‍ය සුදුසුකම් සහ නුසුදුසුකම් ;

(ඊ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම ; සහ

(උ) පොදුවේ සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සහ සංස්ථාව විසුරුවා හැරීම.

(2) සංස්ථාව විසින් සාදන ලද යම් රීතියක් මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සාදන ලද රීතියක් මෙන්ම එවැනිම රැස්වීමක දී එවැනිම ආකාරයෙන් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සැම කල්හි ම සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

(4) මෙම වගන්තිය යටතේ සාදනු ලැබූ සංස්ථාවේ රීති ගැසට් පත්‍රයේ පලකළ යුතු ය.

සාමාජිකයන්ගේ ලේඛනය.

**8.** සාමාජිකයන්ගේ නම්, ලිපින සහ වෙනස් අත්‍යවශ්‍ය තොරතුරු ඇතුළත් කරන ලද සාමාජිකයන්ගේ ලේඛනයක් කමිටුව විසින් පවත්වාගෙන යා යුතු ය.

සංස්ථාවේ අරමුදල.

**9.** (1) සංස්ථාවට එහි ම අරමුදලක් තිබිය යුතු ය.

(2) සංස්ථාව සඳහා සහ වෙනුවෙන් ත්‍යාග, රික්තවරණ, පරිත්‍යාග, ග්‍රාහක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන වශයෙන් ලැබෙන සියලුම මුදල්,

කමිටුව විසින් අනුමත කරන ලද බැංකු එකක හෝ වැඩි ගණනක සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්යය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, හා ඉටු කිරීමේ දී සංස්ථාව විසින් දරනු ලබන වියදම් පියවීමට අවශ්‍ය සියලු මුදල් සංස්ථාවේ මුදලින් ගෙවනු ලැබිය යුතු ය.

**10.** (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය. ගිණුම් සහ විගණනය.

(2) සංස්ථාව විසින් එහි ආදායම සහ වියදම, හා බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැළැස්විය යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම්, විගණකාධිපතිවරයා විසින් හෝ ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථාවේ 154 වන ව්‍යවස්ථාව ප්‍රකාර විගණකාධිපතිවරයා විසින් පත් කරනු ලබන සුදුසුකම්ලත් විගණකවරයකු විසින් වාර්ෂිකව විගණනය කරනු ලැබිය යුතු ය.

මේ වගන්තියේ “සුදුසුකම්ලත් විගණකවරයා” යන්නෙන්—

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක් ; හෝ

(ආ) ගණකාධිකාරී ආයතනයක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වන්නා ද, ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියේ යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද, එවැනි වරලත් ගණකාධිකාරි ආයතනයක්,

අදහස් වේ.

වාර්ෂික වාර්තාව.

**11.** (1) කමිටුව විසින් සංස්ථාවේ කටයුතු පිළිබඳ වාර්තාවක් සෑම මුදල් වර්ෂය සඳහා සකස් කරනු ලැබිය යුතු අතර, එම වාර්තාව විගණනය කරන ලද ගිණුම් ප්‍රකාශය සමග වාර්තාව අදාළ වසරට පසුව එන වර්ෂයේ සය මාසයක් ඉකුත් වීමට පෙර සමාජ සේවා විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත හා 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය) පනත යටතේ පත් කරන ලද ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(2) මුදල් වර්ෂය තුළ දී සංස්ථාව වෙත දේශීය හා විදේශීය වශයෙන් ලැබුණු මුදල් පිළිබඳ වෙනම ගිණුමක් (1) වන උපවගන්තියේ සඳහන් වාර්තාව සමග යැවිය යුතු ය.

සංගමය විසින් ගෙවිය යුතු සහ සංගමයට අයවිය යුතු ණය.

**12.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවති සංගමය විසින් ගෙවිය යුතු සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවනු ලැබිය යුතු අතර එදිනට සංගමයට අයවිය යුතු සියලු ණය සහ සංගමයට ගෙවිය යුතු සාමාජික මුදල් සහ දායක මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව වෙත ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් චංචල හා නිශ්චල දේපල දැරිය හැකි බව.

**13.** යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නීයාදනයක් හෝ වෙනත් යම් ආකාරයකින් සංස්ථාව සතුවන චංචල හෝ නිශ්චල යම් දේපලක් අත්කර ගැනීමට සහ දැරීමට මේ පනතේ විධිවිධානවලට යටත්ව නීතියෙන් සංස්ථාවට හැකියාව සහ බලය ඇති අතර, ඒ දේපල විකිණීමේ, උකස් කිරීමේ, හුවමාරු කිරීමේ හෝ වෙනත් ආකාරයකින් නීයාදනය කිරීමේ පූර්ණ බලය ඇතිව 7 වන වගන්තිය යටතේ සාදන ලද සංස්ථාවේ රීතිවලට යටත්ව මේ පනතේ කාර්යය සඳහා සංස්ථා විසින් ඒ සියලු දේපළ දැරිය යුතු ය.

මුදල් සහ දේපල අදළ කර ගැනීම.

**14.** කවර ආකාරයකින් හෝ ලබා ගන්නා සංස්ථාවේ මුදල් හා දේපළ සංස්ථාවේ පරමාර්ථ ඉටු කර ගැනීම කෙරෙහි පමණක් අදළ කරගත යුතු අතර, එයින් කිසිදු කොටසක් සංස්ථාවේ සාමාජිකයන්ට ලාභාංශ මුදල්, ප්‍රසාද දීමනා හෝ ලාභ වශයෙන් ඍජුව හෝ අන්‍යාකාරයෙන් නොගෙවිය යුතු හෝ නොපැවරිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව තැබිය යුත්තේ කෙසේ ද යන බව.

**15.** (1) කමිටුවේ සාමජිකයන් දෙදෙනෙකුගේ ඉදිරිපිට දී හැර සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු අතර, ඔවුන් දෙදෙනා තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු ය. එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමකට පරිබාහිරව විය යුතු ය.

(2) සංස්ථාවේ මුද්‍රාව, කමිටුව විසින් තීරණය කරනු ලැබිය හැකි කමිටුවේ යම් ධුර දරන නිලධාරියකු භාරයේ තිබිය යුතු ය.

විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපළ.

**16.** (1) සංස්ථාව විසුරුවා හැරීමේ දී, එහි සියලු ණය සහ බැරකම් ගෙවා සමථයට පත්කිරීමෙන් පසු කවර හෝ යම් දේපළක් ඉතිරි වුවහොත්, ඒ දේපළ සංස්ථාවේ සාමාජියන් අතර බෙද දෙනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් අදයමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදදීම තහනම් කර ඇත්තා වූ ද, වෙනත් ආයතනයකට ඒ දේපළ දීම  හෝ පැවරීම කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා උචිත ආයතනය සංස්ථාව විසුරුවා හැරීමට පෙරාතුව ම සංස්ථාවේ සාමාජිකයින් විසින් සභාවේ යම් මහා සභ රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කළ යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**17.** ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ අවස්ථාවක දී සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**18.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.